බප/හො/මොරගහහේන මහා විද්‍යාලය

පළමු වාර පරීක්ෂණය - 2024

10 ශ්‍රේණිය - ඉතිහාසය - I

කාලය පැය 01 යි.

නම/විභාග අංකය : ………………………………………………………………

- **ප්‍රශ්න** සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට **40 තෙක් ප්‍රශ්න වල දී ඇති** $(i), (ii), (iii), (iv)$ පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** පිළිතුර තෝරන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01) මහාවංසයෙහි මුල් කොටස රචනා කරන ලද්දේ කවුරුන්ද?

(i) බුද්ධඝෝෂ හිමි (ii) මහානාම හිමි (iii) ධර්මකිත්ති හිමි (iv) ශ්‍රී රාහුල හිමි

02) ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර පැරණිතම කෘතිය ලෙස සැලකෙන්නේ,

(i) චූලවංසය (ii) මහාවංසය (iii) බෝධිවංසය (iv) දීපවංසය

03) ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී දීපවංශයෙන් ලබා ගත හැක්කේ කුමන කාලයක් දක්වා තොරතුරු ද?

(i) මහසෙන් රජු සමයෙන් පසු කාලීන තොරතුරු ය.
(ii) දුටුගැමුණු රජු දක්වා තොරතුරු ය.
(iii) මහසෙන් රජු සමය අවසානය දක්වා ය.
(iv) පළමුවන පරාක්‍රමබාහු රජ සමය දක්වාය.

04) මහාවංසයේ අර්ථ විග්‍රහ කර ගැනීම සඳහා රචනා වී ඇති ග්‍රන්ථය කුමක් ද?

(i) වංශත්තප්පකාසිනිය
(ii) පූජාවලිය
(iii) නිකාය සංග්‍රහය
(iv) රාජාවලිය

05) ශාසන ඉතිහාසය පිළිබඳ තොරතුරු ලබා ගත හැක්කේ,

(i) රාජාවලිය
(ii) නිකාය සංග්‍රහය
(iii) පූජාවලිය
(iv) ථූපවංශය

06) ඉතිහාසය ඉගෙන ගැනීමේ දී මූලාශ්‍ර නමින් හඳුන්වන්නේ,

(i) විදේශිකයන් විසින් ලියන ලද වාර්තාය
(ii) අතීතය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මාර්ගය
(iii) ලංකාව පුරා විසිරුණු සෙල්ලිපිය
(iv) ලංකාවේ ලියවුණු පොත්පත් ය

07) අතීත ප්‍රජාව විසින් විවිධ කාල වකවානු වල ලියන ලද ග්‍රන්ථ හා ලේඛන හඳුන්වනු ලබන්නේ,

(i) වංසකතා නමින් ය.
(ii) අට්ඨකතා නමින් ය.
(iii) සාහිත්‍ය මූලාශ්‍රය යන නමින් ය.
(iv) පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ය.

08) පහත සඳහන් දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතරින් ග්‍රන්ථය සහ කර්තෘ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) නැඹුරාලිස් හිස්ටෝරියා - මෙගස්තිනස් (ii) ඩිමුන්ඩෝ - ඔනෙසික්‍රිටස්
(iii) භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය - ටොලමි (iv) සීලප්පදිකාරම් - රිබෙයිරෝ

09) භික්ෂූන් වහන්සේලාට ලෙන් පිදීම වැනි දේ වාර්තා කර තැබීමට මෙරට ලියා ඇති පැරණිතම ශිලා ලේඛන වර්ගය වන්නේ

(i) බ්‍රාහ්මීය ලිපි (ii) ගිරි ලිපි (iii) පුවරු ලිපි (iv) ආසන ලිපි

10) පැරණි ජනතාවගේ නිර්මාණාත්මක හැකියාව තාක්ෂණය හා පරිසර සංරක්ෂණ හැකියාව පිළිබඳ නිරවුල් දැනුමක් ලබා ගැනීමට උපයෝගි කර ගත හැකි මූලාශ්‍රය වන්නේ

(i) වංසකතා ය (ii) පැරණි කාසි ය (iii) පුරාණ නටඹුන්ය (iv) සෙල්ලිපි ය

11) පුරාණ සංදේශ කාව්‍ය ලිවීම ආරම්භ වුයේ පහත කිනම් යුගයක ද ?

(i) මහනුවර (ii) දඹදෙණිය (iii) කෝට්ටේ (iv) ගම්පොළ

12) දීර්ඝතම සෙල්ලිපිය වන ගල්පොත සෙල් ලිපිය කරවන ලද රජතුමා වන්නේ,

(i) නිශ්ශංකමල්ල (ii) මනක (iii) මහාපරාක්‍රමබාහු (iv) I විජයබාහු

13) නාණක විද්‍යාව යනු,

(i) ගොඩනැගිලි පිළිබඳ ව හදාරණ විද්‍යාවයි.
(ii) ලෝහ පිළිබඳ ව හදාරණ විද්‍යාවයි.
(iii) චිත්‍ර පිළිබඳ ව හදාරණ විද්‍යාවයි.
(iv) කාසි පිළිබඳ ව හදාරණ විද්‍යාවයි.

14) හක්ගෙඩිය, ගොන් කුරය, ඇත් අඩිය වැනි රූපසටහන් මඟින් පෙන්නුම් කරන්නේ,

(i) පැරණි මාර්ග සලකුණු ය. (ii) පැරණි ප්‍රාදේශීය මායිම් ය.
(iii) පැරණි නින්දගම් මායිම් ය. (iv) පැරණි පුරා වස්තු පිළිබඳ සලකුණු ය.

15) පුරාවස්තු අප විසින් ආරක්ෂාකර ගත යුත්තේ ඇයි.

(i) අපේ පැරණි මුතුන් මිත්තන්ගේ නිර්මාණ නිසාය.
(ii) ඒවාට හානි කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වන නිසාය.
(iii) අපේ අතීත පරම්පරාව ඒවා ආරක්ෂා කළ නිසාය.
(iv) ශ්‍රී ලාංකික අනන්‍යතාවය පෙන්නුම් කිරීමට ඉවහල් වන නිසාය.

16) මූලාශ්‍රය පරිශීලනයේ දී වඩාත් වැදගත් මින් කුමන ක්‍රමය ද ?

(i) විචාර බුද්ධියෙන් යුතුව පරිශීලනය කිරීම.
(ii) සියලුම තොරතුරු ඒ අයුරින්ම පිළිගැනීම
(iii) එක් මූලාශ්‍රයක් වෙත පමණක් අවධානය යොමු කිරීම
(iv) එක් කතුවරයෙකු කෙරෙහි පමණක් විමර්ශනය කිරීම

17) පහත $A$ තීරුව හා $B$ තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ.

| ***A*** **තීරුව** | | $B$ **තීරුව** | |
|---|---|---|---|
| 1. | ලෙන් ලිපි | P | ගල්පොත ශිලා ලිපිය |
| 2. | ගිරි ලිපි | Q | වේගිරිය ලිපිය |
| 3. | ටැම් ලිපි | R | බදුලු ටැම් ලිපිය |
| 4. | පුවරු ලිපි | S | ගඩලාදෙණිය සෙල් ලිපිය |

(i) Q , R , S , P (ii) Q , S , R , P (iii) P , R , S , Q (iv) P , S , Q , R

18) ඓතිහාසික මූලාශ්‍ර වල සඳහන් නොයෙකුත් වෘත්තිකයන් විසූ ගම් කිහිපයක් " අ " තීරුවේ ද ඒවායේ විසූ වෘත්තිකයන් " ආ " තීරුවේ ද දැක්වේ. " අ " හා " ආ " තීරු ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| **" අ " තීරුව** | | **" ආ " තීරුව** | |
|---|---|---|---|
| 1. | කසීකාරගාම | A | ධීවරයන් |
| 2. | කේවට්ටගාම | B | ගොපල්ලන් |
| 3. | වඩ්ඪකීගාම | C | වඩුවන් |
| 4. | කුම්භකාරගාම | D | වළං සාදන්නන් |
| | | E | ගොවියන් |

(i) D , A, C , E (ii) B , C , E , A (iii) B , A , C , E (iv) D , B , E , C

19) තිස්සමහාරාම වැව ඉදිකරන ලදැයි සැලකෙන රජතුමා වන්නේ මින් කවුරුන් ද?

(i) මහසෙන් රජතුමා (ii) ඉළනාග රජතුමා
(iii) පළමුව අග්බෝ රජතුමා (iv) ධාතුසේන රජතුමා

20) ඔලගම් යනුවෙන් අතීතයේ හඳුන්වා දී ඇත්තේ කුමන ගම් ද?

(i) ජනතාව විසින් අතහැර දැමූ ගම් (ii) වරාය ආශ්‍රිතව තිබූ ගම්
(iii) වැවක් කේන්ද්‍ර කොටගෙන වර්ධනය වූ ගම් (iv) වෙළඳ ගම්

21) ඓතිහාසික යුගයේ මූලික ජනාවාස පැතිරෙන්නේ ගංගා නිම්න වල නොව ඊට පිටතින් පිහිටි ප්‍රදේශ වලය. මීට බලපෑ හේතුව වන්නට ඇත්තේ,

(i) ස්වභාවික සම්පත් වල ව්‍යාප්තියයි.

(ii) එහි පසේ තිබෙන සාරවත් බව නිසයි.

(iii) ගංගා මගින් වාර්ෂිකව ගෙනෙන විනාශකාරී ගංවතුර පාලනයට සරිලන තාක්ෂණයක් ඒවන විට නිපදවා නොමැති වීම

(iv) කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රමාණවත් පරිදි ජලය ලබා ගැනීමටයි.

22) විහාරයේ දානය සපයා ගැනීමේ කටයුතු වලදී ගැටලුවක් ඇති වුවහොත් දසගම් ඇත්තන් රැස්වී ඒ ගැටලුව විසඳිය යුතු බවට සඳහන් සෙල් ලිපියක් හමුවන්නේ,

(i) ගණේකන්ද විහාරයෙන් ය. (ii) දඹුලු විහාරයෙන් ය.

(iii) තිස්සමහාරාම විහාරයෙන් ය. (iv) කළුදිය පොකුණ විහාරයෙන් ය.

23) ගල් යුගයට අයත් වැඩිම ඇටසැකිළි ප්‍රමාණයක් සොයාගෙන ඇත්තේ,

(i) කිතුල්ගල බෙලිලෙන (ii) පාහියන්ගල

(iii) බටදොඹ ලෙන (iv) බෙල්ලන්බැඳිපැලැස්ස

24) සිය ආහාර සඳහා ගොඩබිම ජීවත් වන බෙල්ලන් වැඩි වශයෙන් යොදා ගත්තේ ගල් යුගයේ කුමන පරිසර කලාපයක ජීවත් වූ වැසියන් ද?

(i) පහතරට තෙත් කලාපය (ii) පහතරට වියළි කලාපය

(iii) පහතරට අතරමැදි වියළි කලාපය (iv) අර්ධශුෂ්ක කලාපය

25) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පුරාවිද්‍යාත්මක සාධක ලැබෙන ස්ථානයක් වන්නේ,

(i) මිහින්තලය (ii) රිටිගල (iii) සිතුල්පව්ව (iv) පාහියන්ගල

26) ශිලා මංජුසා සම්ප්‍රදායට අයත් සුසාන භූමියක් නොවන්නේ මින් කුමක් ද?

(i) හල්දුම්මුල්ල (ii) ඉබ්බන්කටුව

(iii) ගල්සොහොන් කනත්ත (iv) යටිගල්පොත්ත

27) පූර්ව ඓතිහාසික යුගයට අයත් උඩරංචාමඩම නිවාසය පිළිබඳ වැරදි අදහසක් ලබාදෙන වාක්‍ය වන්නේ,

(i) උළු සෙවිලි කළ වහලයකින් සමන්විත වේ.

(ii) නිවසේ බිත්ති වරිච්චි මැටියෙන් ඉදි කර ඇත.

(iii) ඉදිරිපස හා පිටුපස කොටස් බිත්තියකින් වෙන් කර ඇත.

(iv) ආයත චතුරස්‍රාකාර හැඩයෙන් යුක්ත වෙයි.

28) ශ්‍රී ලංකාවේ ගල් යුගයට අයත් සාක්ෂි හමුවන ප්‍රධාන කලාප දෙක වන්නේ,

(i) පාහියන්ගල හා කිතුල්ගල බෙලිලෙන (ii) බෙල්ගන්බැදිපැලැස්ස හා මිනිහාගල්කන්ද
(iii) ඉරණමඩු හා රත්නපුරය (iv) පාහියන්ගල හා බටදොඹලෙන

29) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ තොරතුරු හෙළිකර ගත හැකි මූලාශ්‍රය මින් කවරක් ද?

(i) සෙල්ලිපි (ii) මහාවංශය (iii) ගොඩනැගිලි වල නටඹුන් (iv) ගල් මෙවලම්

30) I විජයබාහු රජතුමාට අයත් පනාකඩුව තඹ සන්නසේ 'අනුරාධපුරය' නම් කිරීමට යොදාගෙන ඇත්තේ,

(i) අනුරපුර (ii) අනුරාධග්‍රාම (iii) නුරුපුර (iv) රාධපුර

31) පූර්ව ඓතිහාසික යුගයට අයත් උඩරංචාමඩම නිවාසයේ එහි වාසය කළ පුද්ගලයින් ආහාරය සඳහා දඩයම් කරන ලද සතුන්ගේ ඇටකටු ඉතිරි වී තිබුණි. එමගින් පැහැදිළි වන්නේ,

(i) ඔවුන් යකඩ ලෝහය භාවිතා කර ඇත්තේ සතුන් දඩයම් කිරීමට බවයි.
(ii) ඔවුන් කෘෂිකාර්මික දිවිපෙවෙතකට හුරු නොවූ බවයි.
(iii) සතුන් දඩයම් කිරීම සම්පූර්ණයෙන්ම අත්හැර නොදැමූ බවයි.
(iv) සතුන් දඩයම් කිරීම ඔවුන්ගේ විනෝදාංශයක් වූ බවයි.

32) ප්‍රාග් ඓතිහාසික යුගයේ රට අභ්‍යන්තරයේ ජීවත් වූ මානවයෝ වෙරළබඩ ප්‍රදේශ හා සම්බන්ධතා පැවැත් වූ බව පැහැදිළි වන්නේ,

(i) ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම් හමුවීමෙනි.
(ii) හිස්කබල් වල ගුරු ගල් ආලේප කළ බවට සාක්ෂි හමුවීමෙනි.
(iii) කළපු බෙල්ලන් හා ලුණු ආහාරයට ගත් බවට සාක්ෂි හමුවීමෙනි.
(iv) මිරිදිය මාළු වර්ග අල්ලාගෙන ආහාරයට ගත් බවට සාක්ෂි හමුවීමෙනි.

33) උඩරංචාමඩමින් සොයා ගන්නා ලද දේ අතර මැටි පබළු කිහිපයක් සිරුර වර්ණ ගැන්වීමට භාවිතා කරන ලද කහ සහ රතු ගුරුගල් දෙකක් හා ඒවා උරච්චි කිරීමට යොදාගත් ඇඹරුම් ගල් දෙකක් ද විය. මෙම සාක්ෂි මගින් පැහැදිළි වනුයේ,

(i) පබළු නිපදවීමේ තාක්ෂණය පූර්ව ඓතිහාසික යුගයේ පැවති බවයි.
(ii) පූර්ව ඓතිහාසික යුගයේ කාන්තා වන් තම රූසපුව අලංකාර කර ගැනීමට මහත් උනන්දුවක් දැක්වූ බවයි.
(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා කෘෂිකාර්මික දිවි පෙවෙතකට හුරු වුවද සතුන් දඩයම් කිරීම සම්පූර්ණයෙන් අත්හැර නොදැමූ බවයි.
(iv) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා චිත්‍ර කලාව සඳහා මහත් උනන්දුවක් දැක් වූ බවයි.

34) ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ පරිසර කලාප තීරණය කිරීමට ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනු ලබන්නේ,

(i) භූ විෂමතාවය (ii) වාර්ෂික වර්ෂාපතනය
(iii) ජනගහනය (iv) ස්වභාවික සම්පත් වල ව්‍යාප්තිය

35) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් සාධක අයත් වන්නේ

(i) ක්‍රි.ව. 2400 ට ය. (ii) ක්‍රි.පූ. 1400 ට ය.
(iii) ක්‍රි.ව. 1400 ට ය. (iv) ක්‍රි.පූ. 2400 ට ය.

36) මුල් ඓතිහාසික යුගයේ මෙරට ජනාවාස වල ව්‍යාප්තිය පෙන්නුම් කරන ප්‍රධාන දර්ශකය කුමක් ද?

(i) ඇළ මාර්ග වල ව්‍යාප්තිය යි. (ii) මහාමාර්ග වල ව්‍යාප්තිය යි.
(iii) කුඩා ගම් වැව් වල වයාප්තිය යි. (iv) මහා වැව් වල ව්‍යාප්තියයි.

37) වියළි කලාපයේ වැඩි වශයෙන් ව්‍යාප්තව ඇති පස් වර්ගය වන්නේ

(i) ලැටරයිට් පස (ii) රතු දුඹුරු පස (iii) මැටි පස (iv) දියළු පස

38) පූර්ව ඓතිහාසික යුගයට අයත් සාධක රැසක් හමුවන නිවාසය පිහිටා ඇති ප්‍රදේශය

(i) රංචාමඩම (ii) උඩරංචාමඩම (iii) හල්දුම්මුල්ල (iv) බෙරගල

39) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා වාසය කළ එළිමහන් කඳවුරු සහ ගල්ගුහා වාසස්ථාන කිහිපයක් " අ " තීරුවේ ද ඒ සඳහා නිදසුන් " ආ " තීරුවේ ද දක්වා ඇත. " අ " තීරුව හා " ආ " තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| " අ " තීරුව | | " ආ " තීරුව | |
|---|---|---|---|
| 1. | වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරු | A | බෙල්ලන්බැඳිපැලැස්ස |
| 2. | පහතරට තෙත් කලාපීය ලෙන් | B | මිනිහාගල්කන්ද |
| 3. | පහතරට වියළිකලාපීය ලෙන් | C | බණ්ඩාරවෙල |
| 4. | පහතරට තෙත් කලාපීය එළිමහන් කඳවුරු | D | කිතුල්ගල බෙලිලෙන |
| | | E | අලිගල |

(i) ADEB (ii) BCAE (iii) BEDA (iv) BDEA

40) පරික්ඛිත ගම් යනු,

(i) වැටකින් ආරක්ෂා වූ ගම් ය. (ii) වැටකින් ආරක්ෂා නොවූ ගම් ය.
(iii) වැටකින් වට වූ ගම් ය. (iv) ඇළකින් වෙන් වූ ගම් ය.